www.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lk

# සී/ස මහියංගණ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බාහිරින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**තනතුර** - මුරකරු
**වැටුප් කේත අංකය** - PL 1-2026
**බඳවා ගැනීමේ ශ්‍රේණිය** - III ශ්‍රේණිය
**වැටුප් පරිමාණය** : 30,000.00 - 250×7-270×9 - 300×11- 330×12 = 41440.00
**වයස් සීමාව** : අවුරුදු 18 සිට අවුරුදු 45 දක්වා
**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** : අ.පො.ස. (සා/පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 02කින් සමත් වීම.

**තනතුර** - ක්ෂේත්‍ර නිලධාරී
**වැටුප් කේත අංකය** - OL 2-2026
**බඳවා ගැනීමේ ශ්‍රේණිය** - III ශ්‍රේණිය
**වැටුප් පරිමාණය** : 37,000.00 - 350X7 -400X9 -450X11- 500X12= 54,000.00
**වයස් සීමාව** : අවුරුදු 18 සිට අවුරුදු 45 දක්වා
**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** : අ.පො.ස (සා/පෙළ) ගණිතය සිංහල/ දෙමළ භාෂාව අතුළුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් එකවර සමත් වීම.

හා

ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස (උ/පෙළ) විෂයයන් 03 කින් එකවර සමත්වීම හෝ ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩල සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව/ සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම.

හා

යතුරුපැදි රියදුරු බලපත්‍රය ලබා තිබීම.

හා

පිළිගත් බැංකු/ වාණිජ/ මූල්‍ය / කාර්මික ආයතනයක ආදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර 01කට නොඅඩු පළපුරුද්ද

❖ සටහන:- ක්ෂේත්‍ර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ දී පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.

**තනතුර** - පරිගණක දත්ත ක්‍රියාකරු
**වැටුප් කේත අංකය** - OL 1-2026
**බඳවා ගැනීමේ ශ්‍රේණිය** - III ශ්‍රේණිය
**වැටුප් පරිමාණය** : 35500 - 330X7 - 350×9 - 400X11 - 450×12 = 50,760
**වයස් සීමාව** : අවුරුදු 18 සිට අවුරුදු 45 දක්වා
**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** : අ.පො.ස. (සා/පෙළ) ගණිතය, සිංහල / දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථ යහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත් වීම

ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උ/පෙළ) විෂයයන් (03 කින් එකවර සමත් වීම හෝ ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩල සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව / සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම.

හා

පිළිගත් ආයතනයක පරිගණක කටයුතු පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

**තනතුර** - ප්‍රවාහන නිලධාරි
**වැටුප් කේත අංකය** - OL 2-2026
**බදවා ගැනීමේ ශ්‍රේණිය** - III ශ්‍රේණිය
**වැටුප් පරිමාණය** : 37,000.00 - 350X7 - 400×9 - 450X11 - 500×12 = 54,000.00
**වයස් සීමාව** : අවුරුදු 18 සිට අවුරුදු 45 දක්වා
**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** : අ.පො.ස (සා/පෙළ) ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 03කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් එකවර සමත් වීම.

හා

ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස (උ/පෙළ) විෂයයන් 03කින් එකවර සමත්වීම හෝ ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩල සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව / සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම.

හා

බර වාහන රියදුරු බලපත්‍රය සමග පිළිගත් ආයතනයකින් මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ NVQ Level 04ට නොඅඩු සහතිකයක් ලබා තිබීම.

හා

පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ තනතුරක වසර 01 කට නොඅඩු පළපුරුද්ද.

සාමාන්‍යාධිකාරි
වැටුප් කේත අංකය - SM2-2026
බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය
වැටුප් පරිමාණය - 55000.00- 560X7-630X9-700X11-790X12=81770.00
වයස් සීමාව අවුරුදු 21 සිට අවුරුදු 45 දක්වා

අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණ / කළමනාකරණ/ වාණිජ/ ගණකාධිකරණ / ආර්ථික විද්‍යාව විෂය ක්ෂේත්‍රයට ආදාළ උපාධියක් ලබා තිබීම.

   හා

   පිළිගත් ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

   හා

   පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 01 කට නොඅඩු පළපුරුද්ද

හෝ

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළ උපාධියක් ලබා තිබීම.

   හා

   පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

   හා

   පිළිගත් ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

   හා

   පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

උක්ත සඳහන් තනතුරු සඳහා ඔබ විසින් ඉල්ලුම්පතක් සකස් කොට තනතුරට අදාළ සහතික පත්‍රවල ඡායා පිටපත්ද සහිතව ඉල්ලුම් කරන තනතුර ලිපියේ වම් පස ඉහළ කෙළවර සඳහන් කොට 2026.11.05 දිනට පෙර ගරු සභාපති, සී/ස මහියංගණ විවිධ සේවා සමුපකාර සමිතිය, මහියංගණය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි.

**සැලකිය යුතුයි -**

මූලික සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ පිළිබඳව කිසිදු දැනුම්දීමක් සිදු කරනු නොලැබේ.

**මෙයට. සභාපති.**
**පී. එම්. චන්ද්‍රසේන බංඩාර,**
**සී/ස මහියංගණ වි.සේ.ස. සමිතිය**

www.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lkwww.gazette.lk